# බුදු රජාණන් වහන්සේට සහ භික්ෂූන්ට පෙරහන් කඩ පූජා කිරීම නිවන දක්වා මහත් ආනිසංස ලබාදේ

## පිළින්දිවච්ඡස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 568 - 571)

හංසවතී නුවර විසූ දොරටුපාලයෙක් පදුමුත්තර බුදු රජුන්ටත් රහතන් වහන්සේලාටත් පෙරහන් කඩ පූජා කළා. එතැන් සිට උපන් භවයන්හි දී ඔහුට මෙසේ ආනිසංස ලැබුණා.

- සියල්ලන්ට ම වඩා වැඩි කාලයක් ජීවත් වුණා.
- සොරුන්ගෙන්, සතුරන්ගෙන් හෝ බලයෙන් යටපත් කිරීමට නොහැකි වුණා.
- ආයුධවලින්, වස විසවලින් කරදර වුණේ නැහැ.
- අකල් මරණ වලට ගොදුරු වුණේ නැහැ.
- අප බුදු රජාණන් වහන්සේගේ සාසනයේ පැවිදි ව සසර ගමන කෙළවර කළා.